# ජපන් රාජ්‍ය පාලනය, බුදු දහම හා එහි ඓතිහාසික පසුබිම

ඩී.එම්. රත්නායක

## සාරාංශය

ගෞතම සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ලෝකයේ විවිධ ප්‍රදේශවලට බුදු දහම පැතිරී ගිය අතර ජපානයට බුදු දහම ලැබෙනුයේ ක්‍රි. ව. හයවන සියවසේදී පමණය. එතෙක් සියවස් දහයක් තරම් වූ මෙම කාල පරිච්ඡේදයේ බුදුදහම විවිධ විපර්යාසයන්ට බඳුන් වෙමින් විවිධ සම්ප්‍රදායන් ඔස්සේ ගලා යාම සිදුවිය. එම විපර්යාසයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ථෙරවාද හෙවත් හීනයාන සම්ප්‍රදාය ද මහායාන සම්ප්‍රදාය ද බිහි වූ අතර චීනය, කොරියාව හා ජපානය ආදි රටවල මහායාන සම්ප්‍රදාය බෙහෙවින් බලාත්මක වූ බව පැහැදිලිය. ක්‍රි.ව. 574-621කාලයේ සිටි සුයිකෝ (Suiko) අධිරාජිනියගේ අමාත්‍යවරයෙකු වූ ෂෝතොකු (Shotoku) කුමරු බුදු දහම රාජ්‍ය ආගම බවට පත් කළේය. kdrd (Nara) අවධියතුළ ප්‍රධාන බෞද්ධ විද්‍යාස්ථාන හයක් බිහිවිය. ඒවා Sanron, Hosso, Kegon, Ritsu, Kusha, Jojits මනම් විය. තවද තෙන්දයි (Tendai) හා ෂින්ගොන් (Shingon) යන නව සම්ප්‍රදායන් දෙකක් චීනයෙන් ජපානයට දායාද විය. ක්‍රි. ව. 1192න් ආරම්භ වන කමකුරා (Kamakura) රාජ්‍ය පාලනය මිනමොතො නො යොෂිමොතො (Minamoto no Yoshimoto) විසින් මෙහෙයවනු ලැබූ අතර Jodo, Jodoshin, Rinzaizen, SotozenydNichiren යන බෞද්ධ සිද්ධස්ථාන පහ ගොඩනැංවීමද මෙම කාලයේදී සිදුවිය.



ක්‍රි.ව.1336-1573කාල පරිච්ඡේදයේ දී ජපන් සංස්කෘතියේ උද්දීපනය සිදු වූ බව පෙනෙයි.මොමොයම (Momoyama) රාජ්‍ය සමය බුදු දහමට එතරම් සුබදායක කාල පරිච්ඡේදයක්නොවීය.ජපානයේ සුවිශේෂී කාල පරිච්ඡේදයක් වන එදෝ (Edo) රාජ සමය ක්‍රි.ව. 1603න් ආරම්භව 1867 දක්වා පැවති අතර මෙම අවුරුදු දෙසිය හැටක් පමණ වූ කාලපරිච්ඡේදය හුදකලා සමයක් සේ හඳුන්වනු ලබයි. එදෝ (Edo) රාජ්‍ය සමයේ අවසානයත් සමඟ 1868 දී ආරම්භ වන මෙයිජි (Meiji) අධිරාජ්‍ය සමය ක්‍රි.ව. 1945 දක්වා පැවතිණ. දීර්ඝ කාලයක් තිස්සේ පැවති හුදකලා බව පහව ගොස් වසර අටසීයක් පමණ පැවති හමුදාපාලනතන්ත්‍රයේ සෙවනැලි ද පහව ගොස් ජපානය බටහිර සංස්කෘතියට හා නව තාක්ෂණයට දොරටු විවර විය. ක්‍රි.ව. 1945න් පසු බුදුදහම නව මුහුණුවරක් ගත් අතර ඉහළ සිට පහළට හා පහළ සිට ඉහළට ගලා යන අන්ත දෙකක් සේ බෙදී යන්නට වූ අතර ඒවා එකිනෙක ගැටෙමින් වර්ධනය වූ බව පෙනේ. වර්තමානයේ දී ජපන් වැසියා බුදු දහම, ෂින්තෝ (Shinto) දහම සහ කොන්පියුසියස් (Confucius) දහම අඩු වැඩි වශයෙන් තම ජීවිතයට යොදා ගෙන ඇති බැවින්, බහු ආගමික ස්වරූපයක් ගෙන තිබෙන බවද පෙනේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ 530 දී පමණය ජපානයට ලැබුණු බුදුදහම සහ ජපන් රාජ්‍ය පාලනය අතර කෙබඳු සබඳතාවක්පැවතියේද යන්න විමසා බැලීමයි.

මේ සඳහා ජපන් ජාතික Kōdō Matsunami හිමියන් විසින් රචිත බොහෝ දෙනාගේ ඇගයීමට ලක්වූ "A Guide to Japanese Buddhism" යන ග්‍රන්ථයේ පළමුවන කොටසේ සිංහල අනුවාදයක් ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. මෙහි දී සාකච්ඡා කරනු ලබන්නේ ක්‍රි.ව. 6 වන සියවසේ සිට වර්තමානය දක්වා ජපන් රාජ්‍ය පාලනය තුළ බුදුදහම හා අනෙකුත් ප්‍රධාන ආගම් වන ෂින්තෝ (Shinto) සහ කොන්පියුසියස් (Confucius) වැනි දර්ශනවාද සමඟ සම්මිශ්‍රණය වෙමින් සිදු වූ බලපෑම පිළිබඳවයි.

## හැඳින්වීම

ගෞතම බුද්ධ භාෂිතයේ ආගමික ස්වරූපයක් ගැබ් වී තිබුණ ද එය විශ්වීය දර්ශනයක් සේ හැඳින්වීම වඩාත් යුක්ති යුක්තය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ලෝකයේ විවිධ ප්‍රදේශවලට බුදුදහමේ

ආලෝකය පැතිරී ගිය අතර ජපානයට බුදුදහම ලැබෙන්නේ ක්‍රි.ව. හයවන සියවසේදීය. එනම් සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් දහයක් තරම් කාල පරිච්ඡේදයකට පසුවය. ඒ එවකට කොරියානු අධිරාජයාව සිටි බයෙක්ජෙගේ (Baekje) අනුග්‍රහයෙනි. විවිධ විපර්යාසයන්ට බඳුන් වූ බුදුදහමේ පශ්චාත්කාලීනව හීනයාන හෙවත් ථෙරවාද සම්ප්‍රදාය ද මහායාන සම්ප්‍රදාය ද විද්‍යමාන වේ. ජපානයේ දැකිය හැක්කේ මහායාන සම්ප්‍රදායානුකූලව බුදු දහම වන අතර සද්ධර්ම පුණ්ඩරීක, අවලෝකිතේශ්වර හා අමිතාභ වැනි මාතෘකා ප්‍රධාන තැනක් ගනී. අපට හුරු පුරුදු හීනයාන හෙවත් ථෙරවාද සම්ප්‍රදායට වඩා මහායාන බෞද්ධ සම්ප්‍රදායේ වෙනස්කම් රැසක් දැකිය හැකිය. ජපානයේ බුදුදහම පිළිබඳව විමසීමේදී මෙම තත්ත්වය මෙම මැනවින් පැහැදිලි වේ. වර්තමාන ජපන් ජන ජීවිතයේ සෙන් (Zen) දහම හා ෂින්තො (Shinto) දහම අඩු වැඩි වශයෙන් ඒකාබද්ධ වී පවතින බැවින් ජපන් වැසියා එක් ආගමික මතවාදයක් මත පදනම් නොවී සිටීමට දක්වන කැමැත්තක් විශේෂත්වයකි.

### පර්යේෂණ අරමුණ

ජපානයේ බුදුදහම හා රාජ්‍ය පාලනය අතර පැවති සබඳතාව පිළිබඳ අවබෝධයක් ලබාගැනීම මෙහි අරමුණවේ.

### පර්යේෂණ ක්‍රමවේදය

ජපන් ජාතික Kōdō Matsunami හිමියන්ගේ "A Guide to Japanese Buddhism" කෘතියේ පළමු කොටසේ සිංහලානුවාදයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

### පර්යේෂණ ගැටළුව

ජපානයේ බුදුදහම හා රාජ්‍ය පාලනය අතර අතීතයේ කෙබඳු සබඳතාවක් පැවතියේද යන්නයි.

### සාකච්ඡාව

ලෝකයේ බොහෝ රටවලට බුදු දහමේ පණිවිඩය ලැබී සියවස් දහයකට තරම් පසුව එනම් ක්‍රි. ව. 538 දී පමණ ජපානයට බුදු දහම ලැබිණි. එවකට ජපානයේ අධිරාජයා වූ කිම්මෙයි (Kimmei) වෙත කොරියානු අධිරාජයාව සිටි බයෙක්ජෙ (Baekje) විසින් ඉතා



මනරම් බුද්ධ ප්‍රතිමාවක්ද බුද්ධ භාෂිතය ඇතුළත් ග්‍රන්ථ සමූහයක් ද ආභරණ රැසක් ද ත්‍යාග වශයෙන් යවන ලද්දේය. එවකට ජපන් අධිරාජයා ගේ අමාත්‍ය මණ්ඩලය හා මොනොනොබෙ (Mononobe) නකනොමි (Nakanomi) හා සෝගා (Soga) යන වංශවලට අයත් නීති විශාරදයන්, උපදේශකයන් අතර මෙම දහම පිළිගන්නවාද නැද්ද යන්න පිළිබඳව විවිධ මතිමතාන්තර ඇතිවිය. විශේෂයෙන්ම මොනොනොබෙ (Mononobe) නකනොමි (Nakanomi) වංශිකයන් එවකට පාරම්පරික දේශීය ෂින්තො (Shinto) දහම පැවතීම හේතුවෙන් එකහෙලාම මෙයට සිය විරෝධතාවය පල කළ අතර සෝග (Soga) වංශිකයන් මෙය පිළිගත යුතු බවට තරයේ ප්‍රකාශ කර සිටියේය. සෝග (Soga) වරුන් තම රටට ලැබුණු නව දහමෙන් තමන්ගේ සංස්කෘතිය පෝෂණය කිරීමට බොහෝ දේ උකහා ගත හැකි යැයි තරයේ විශ්වාසය පළ කර සිටියේය. අවසානයේ දී මේ සියලු මතිමතාන්තර පසෙකලා සෝග (Soga) වරුන් වෙත මෙහි වගකීම පැවරීමට අධිරාජයා තීරණය කළේය.

මෙයින් වසර හතළිහකට පමණ පසුව බලයට පත් වූ සුයිකො (Suiko) අධිරාජිනිය විසින් ප්‍රධාන අමාත්‍ය ලෙස ෂෝතොකු (Shotoku) කුමරු (ක්‍රි.ව. 574 - 621) පත්කළ අතර ඔහු බුදු දහම රාජ්‍ය ආගම බවට පත් කළේය. බෞද්ධයකු වූ මොහු සිය රටේ සංස්කෘතික සාරධර්මයන්ගෙන් හෙබි එක්සත් එකමුතු ජන සමාජයක් ගොඩනැගීම බුදු දහමේ ඉගැන්වීම්වලින් පමණක්ම සිදු කළ හැකිය යන්න තරයේ විශ්වාස කළේය. මොහුගේ මෙම අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රි.ව. 604 දී වගන්ති 17 කින් යුත් නව ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කළ අතර මෙහි දෙවන වගන්තියේ සඳහන් වන්නේ සියල්ලෝම තිසරණ සරණ යා යුතු බවත් "තිසරණය" මාර්ගෝපදේශකත්වයේ ලා සැලකිය යුතු බවත්ය. එසේ ම හැකි තරම් බෞද්ධ විහාරස්ථාන ගොඩ නඟන ලෙසද රජයට නියෝග කළේය. එවකට ජපානයේ අග නගරය වූ නාරා (Nara) හි පිහිටි හොර්යුජි (Horyuji) විහාරස්ථානය අදට ද දැක ගැනීමට හැකි අතර මෙය ද ජපානයේ බුදු දහම මුල් බැස ගැනීමට මෙය ද හේතු විය.

බුදුදහමේ ව්‍යාප්තියක් සමඟ ජපානයේ දේශපාලනික සහ සංස්කෘතික පුනරුදයක් විද්‍යමාන වූ අතර මේ නිසාම අමාත්‍ය උපදේශක මණ්ඩලයේ අපේක්ෂාව වූයේ විධිමත් ලෙස බුදුදහම

සමාජගත කිරීමයි. විශේෂයෙන්ම මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුව වූයේ බුදු දහමෙන් මානසික සහ අන්තර් සාමයික සහජීවනය එවකට පැවති ෂින්තො (Shinto) දහමට වඩා හොඳින් ගොඩ නැගිය හැකි බව විශ්වාස කිරීමයි. මේ වන විට ජපන් භාෂාවෙන් බෞද්ධ පොතපත ලියැවී නොතිබූ අතර, චීන භාෂාවෙන් ලියැවුණු බෞද්ධ පොතපත භාවිත කළ බව පෙනේ. එසේම ආරම්භයේදී සමාජයේ උගත් වංශිකයන්ට පමණක් බුදු දහම සීමා වුවද පශ්චාත්කාලීනව ඒ ඒ සමාජ ස්ථරයන්හි ජනතාවට බුදු දහම වැළඳ ගැනීමට අවස්ථාව උදා විය.

ෂෝතොකු (Shotoku) කුමරුගේ අභාවයෙන් පසුව ද රාජ්‍ය නායකයින්, භික්ෂූන් සහ කලාකරුවන් අතර බුදුදහම ඉතා හොඳින් දීප්තිමත්ව පැවැති අතර පසුව බලයට පැමිණි ෂෝමු (Shomu) අධිරාජයා විසින් නාරාහි (Nara) තෝදයිජි (Todaiji) කේන්ද්‍ර කරගත් කොකුබුංජි (Kokubunji) හෙවත් ජාතික විහාරස්ථාන සෑම පළාතකම ගොඩනැංවීමට කටයුතු කළේය. එවකට පැවති බොහෝ බෞද්ධ පොත පත චීනයෙන් ලැබුණු අතර ඒවා වැඩි වෙනසකට භාජනය නොකර ජපාන භික්ෂූන් වහන්සේ විසින් ද පරිශීලනය කළ බව පෙනේ. බුදු දහමේ ආභාසයෙන් විවිධ කැටයම්, කලා නිර්මාණ ජපානයේ කලා කරුවාගේ අතින් නිමැවුණු අතර අදට ද ජපානයේ පෞරාණික වෙහෙර විහාරස්ථානවල මෙම උසස් කලා නිර්මාණ දැකිය හැකිය. මෙම අවධියේ දී ජපාන විහාරස්ථාන හුදෙක් ආගමික ස්ථානය ලෙස පමණක් නොව ජපාන සංස්කෘතික මධ්‍යස්ථාන ලෙස ද පැවැති බව පෙනේ. මේවා වන්දනාමාන කිරීම සඳහා පමණක් නොව පාසල්, රෝහල්, වෛද්‍ය සායන, අනාථ නිවාස සහ වැඩිහිටි නිවාස ලෙස ද භාවිත විය. විශේෂයෙන්ම ජපන් භික්ෂූන් වහන්සේලා ගුරුවරුන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් ලෙස විවිධ සංවර්ධන ව්‍යාපෘතිවල සේවය කළ නිසා ජපන් රජය ද බෞද්ධ සිද්ධස්ථානවලට උදව් උපකාර කිරීම නිසා රජය හා ජනතාව සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමට මෙම ආගමික ස්ථානවලට හැකියාව ලැබුණි. තවද භික්ෂූන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ යාම නිසා ප්‍රධාන සම්ප්‍රදායන් 6ක් වටා ජනතාව ඒකරාශි වන්නට විය. මේ සියල්ලම පාහේ චීනයෙන් පැමිණි සම්ප්‍රදායන් වූ අතර එකම විහාරස්ථානයක විවිධ සම්ප්‍රදායන් සේ පැවතුණි. මෙම සම්ප්‍රදායන්



සන්රොන් (Sanron) හොස්සෝ (Hosso) කෙගොන් (Kegon) රිත්සු (Ritsu) කුෂ (Kusha) සහ ජෝජිත්සු (Jojitsu) නමින් හැඳින්වූ අතර පසුකාලීන බෞද්ධ දාර්ශනික අදහස් සංවර්ධනය කිරීමෙහිලා විශේෂ කාර්යභාරයක් ඉටුකර ඇත.

ක්‍රි.ව. 794 සහ 1105 අතර පැවති හෙයිඅන් (Heian)පාලන සමයට පෙරාතුව එනම් ක්‍රි.ව. 784 පමණ එතෙක් නාරාවල (Nara) පිහිටි ජපන් අගනුවර ක්යෝතෝවලට (Kyoto) සංක්‍රමණය වීමත් සමඟ ක්යෝතෝ (Kyoto) ජපානයේ අගනුවර සේම බෞද්ධ කේන්ද්‍රස්ථානය බවට ද පත්විය. මෙම කාල පරිච්ඡේදයේ දී තෙන්දයි (Tendai) හා ෂින්ගොන් (Shingon) නමින් නව බෞද්ධ සම්ප්‍රදායන් දෙකක් චීනයෙන් ජපානයට සංක්‍රමණය වූ අතර කලින් පැවති සම්ප්‍රදායන් 6 සමඟ ඒකාබද්ධ වූ බව පෙනේ. ක්‍රි. ව. 767-822 අතර කාලයේ ජීවත් වූ සයිචෝ (Saicho) විසින් ඉහත සම්ප්‍රදායකට අයත් තෙන්දයි (Tendai) මධ්‍යස්ථානය ක්යෝතෝ (Kyoto)හි හිඑයි (Hiei) කඳු ප්‍රදේශයේ ගොඩනගා එවකට පැවති සියලු බෞද්ධ සම්ප්‍රදායන් ඒකාබද්ධ කිරීමට උත්සාහ කළ බව පෙනේ . ඔහු චීනයේ අධ්‍යාපනය ලැබූ අවධියේ තිඅන්දයි (Tiandai) බෞද්ධ සම්ප්‍රදාය, සෙන් (Zen) බුදු දහම සහ ශුද්ධ භූමි (Pureland) බුදු දහම ආදි කොට ඇති විවිධ සම්ප්‍රදායන් අධ්‍යයනය කළේය. විශේෂයෙන්ම ථෙරවාද සම්ප්‍රදායේ ඉගැන්වීම් ඇතුළත් බ්‍රහ්මජාල සූත්‍රය අධ්‍යයනය කළේය. ඔහුගේ ජපානය සම්ප්‍රාප්තියත් සමග ෂැන්රොන් (Shanron) සහ හොස්සෝ (Hosso) සම්ප්‍රදායන් සම්බන්ධ කරගෙන සද්ධර්මය පුණ්ඩරීක සූත්‍රය පදනම් කරගත් ඒකායන මාර්ගය ගොඩ නැංවීමට දායක විය. එයින් අවධාරණය වූයේ ජීවිතයේ සියලු අංශයන් එකම පදනමක් මත පිහිටුවීමෙන් පමණක් ම බුද්ධත්වයට පත්වීමේ හැකියාව ඇති බවයි. මෙම බුදුදහමේ සහ ෂින්තෝ (Shinto) දහමේ සංකලනයක් ලෙස ද පෙනී යයි.

මෙම අවධියේ දී හීනයාන හෙවත් ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායේ පිහිටා කටයුතු කිරීමට ජපාන භික්ෂූන් වහන්සේට සිදු වුවත් මෙම තත්ත්වයට සයිචෝ (Saicho) හිමියන්ගේ වැඩි කැමැත්තක් නොතිබූ අතර උන්වහන්සේට අවශ්‍ය වූයේ ජපාන භික්ෂූන් වහන්සේට ගැළපෙන මහායාන සම්ප්‍රදායන් ප්‍රචලිත කිරීමයි. උන්වහන්සේ විසින්

කීප වතාවක්ම සෝග (Soga) අධිරාජයාට මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කළද ඒ සඳහා අවසරය හිමි වූයේ ඔහුගේ අභාවයෙන් පසු එනම් ක්‍රි. ව. 822 පමණය. මේ තීරණයත් සමග තෙන්දයි (Tendai) සම්ප්‍රදාය අනෙකුත් සම්ප්‍රදායන් හා සංකල්පයන්ගෙන් නිදහස් වූ අතර ථෙරවාද සම්ප්‍රදායෙන් ද ගිලිහී ගියේය. සයිචෝ (Saicho) හිමියන්ගේ ඇවෑමෙන් මෙම තෙන්දයි (Tendai) සම්ප්‍රදායේ ප්‍රධානීන් දෙදෙනෙකු වූ එන්නින් (Ennin) ක්‍රි. ව. 794-864 සහ එන්චින් (Enchin) ක්‍රි.ව.814-891 චීනයේ දී තෙන්දයි (Tendai) බෞද්ධ සම්ප්‍රදාය සහ එසෝතරික් (Esoteric) දහමේ චාරිත්‍ර විධි අධ්‍යයනය කළ අතර ඔවුන්ගේ දායකත්වයෙන් සිය උපදේශක සයිචෝ (Saicho) හිමියන්ට සම්පූර්ණයෙන්ම ග්‍රහණය කරගත නොහැකි වූ එසෝතරික් (Esoteric) චාරිත්‍ර විධි ක්‍රම ක්‍රමයෙන් සමාජගත කරන්නට හැකියාව ලැබිණි.

සයිචෝ (Saicho) හිමියන්ගේ අනුගාමිකයකු වූ කුකයි (Kukai- ක්‍රි.ව. 774-835) හිමියන්ද චීනයේදී එසෝතරික් (Esoteric) දහම ඉගෙනීමෙන් පසු ජපානයට පැමිණ කෝයා (Koya) කඳු ප්‍රදේශයේ ෂින්ගොන් (Shingon) මධ්‍යස්ථානය ගොඩනැගූ අතර මහා වෛරෝචන සූත්‍රය පදනම් කරගත් කල්පිත ඉගැන්වීම් සහ වෛරෝචන බුදුන් පිළිබඳ සංකල්පය සමාජගත කළේය. කුකයි (Kukai) හිමියන් සයිචෝ (Saicho) හිමියන් මෙන් ථෙරවාද සම්ප්‍රදාය බැහැර නොකළ අතර ථෙරවාද හෙවත් හීනයාන හා මහායාන සම්ප්‍රදායන් දෙකම පිළිගත්තේය. එසේම තමා උගත් එසෝතරික් (Esoteric) දහමට අනුව ඒවා ඔහු අර්ථ නිරූපණය කළේය. ඔහු විසින් බෞද්ධ ඉගැන්වීම් කොටස් දෙකකට බෙදා වෙන් කළ අතර ෂින්ගොන් (Shingon) නිකාය හැර අනෙක් සියලු නිකායන් එක්සෝතරික් (Exsoteric) ලෙස නම් කරන ලද අතර එසේ වීමට හේතුව මෙම සම්ප්‍රදායන්ට පදනම වූයේ ඓතිහාසික ශාක්‍යමුණි බුදුන් වීමයි. අනෙක් අතට එක්සෝතරික් (Exsoteric) සම්ප්‍රදායේ දී සත්‍යය සැඟවී පවතින අතර එය අනාවරණය කරගත යුතුවේ. විශ්වයේ දන්නා පුද්ගලයෙකු සහ දන්නා දෙයක් තිබේ. ඒවා වටහා ගත හැක්කේ වෛරෝචන බුදුන්ගේ කල්පිත අභ්‍යාසයෙන් සහ විවිධ මුද්‍රා මගිනි. මෙයින් විශ්ව සාමය උදාවේ. තවද කුකයි (Kukai) විසින් එවකට පැවැති සියලු සම්ප්‍රදායන් ඒ ඒ සම්ප්‍රදායන්ගේ අන්තර්ගත වූ සංකල්පයන්ගේ ස්වභාවය සලකා අංශ 10කට බෙදා වෙන් කළේය.



එනම්;

1. කිසිදු විශේෂ ඉගැන්වීමක් නොමැති
2. කොන්ෆියුසියස් සහ තාඕ දර්ශන
3. ශාංඛ්‍ය හා වෛශේෂික දර්ශන
4. කුෂ (Kusha) සම්ප්‍රදාය
5. ජෝජිත්සු (Jojitsu) සම්ප්‍රදාය
6. හොස්සෝ (Hosso) සම්ප්‍රදාය
7. සන්රොන් (Sanron) සම්ප්‍රදාය
8. තෙන්දයි (Tendai) සම්ප්‍රදාය
9. කෙන්ගොන් (Kengon) සම්ප්‍රදාය
10. ෂින්ගොන් (Shingon) සම්ප්‍රදාය යනුවෙනි.

කෙසේ වුවද තෙන්දයි (Tendai) සම්ප්‍රදායේ දාර්ශනික දෘෂ්ටිය හා ෂින්ගොන් (Shingon) සම්ප්‍රදායේ කල්පිත චාරිත්‍ර විධික්‍රම පමණක් රාජ වංශිකයන්ගේ සහ භික්ෂූන් වහන්සේගේ සිත් ඇද ගැනීමට සමත් විය. එසේම ඔවුන් ආගමික අභ්‍යාසවලට වඩා න්‍යායාත්මක ලක්ෂණ අධ්‍යයනය කළ බව පෙනේ. එසේම මෙම තෙන්දයි (Tendai) හා ෂින්ගොන් (Shingon) සම්ප්‍රදායන් දෙක රාජ්‍ය අනුග්‍රහය ද ලබමින් අනෙකුත් සම්ප්‍රදායන්ගෙන් වෙන්ව නිදහසේ වැඩෙන්නට විය.

මෙකල සමාජ ක්‍රමය අනුව භික්ෂූන් වහන්සේ සමාජයේ වරප්‍රසාදලාභී පිරිසක් වූ බැවින් සමාජයේ තුන්වන බලවේගය ලෙස ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් ජීවිතය ගත කළහ. එසේම මෙම විහාරවාසී ජීවිතය හුදෙක්ම ඒකාකාරී වූ අතර සමහර මධ්‍යස්ථාන ඒවායේ පැවැති දූෂණ කටයුතු නිසාම පරිහානියට ලක් විය. මෙම තත්ත්වය දුටු සාමාන්‍ය ජනයා බොහෝ සෙයින් කලකිරීමට පත්ව මන්දෝත්සාහී වූ අතර ජීවිතයේ අනිත්‍යතාවය පිළිබඳව ගැඹුරින් සිතන්නට පෙළඹුණි. බුදුදහම වරප්‍රසාදලාභී රාජවංශිකයන්, භික්ෂූන්, වියතුන්, කලාකරුවන් සඳහා වෙන්ව තිබූ අතර එහි ඇති සංකීර්ණ දාර්ශනික අදහස් චාරිත්‍ර විධි ආදිය පිළිබඳව ඔවුහු නිදහසේ අධ්‍යයනය

කළහ. කමකුරා (Kamakura) රාජ්‍ය අවධියේ දී නොසිතූ විපර්යාසයක් ආගමික ක්ෂේත්‍රයේ සිදු වූ අතර පළමු වරට බුදුදහම මහජනතාවගේ ආගම බවට පත්විය. පැවති රාජ්‍ය පාලන ක්‍රමය කමකුරා (Kamakura) අවධියේ දී (ක්‍රි.ව.1192-1332) හමුදා පාලනයකට පරිවර්තනය විය. මෙම සංක්‍රාන්ති සමයේ දී හෝනෙන් (Honen ක්‍රි.ව.1133-1212) Iskarka (Shinran- ක්‍රි.ව. 1173-1262)ද එයිසන් (Eisan- ක්‍රි.ව.1141-1215)ද දෝගෙන් (Dogen- ක්‍රි.ව. 1200 -1253)ද නිචිරෙන් (Nichiren- ක්‍රි.ව. 1222-1282) ඇතුළු තවත් බෞද්ධ නායකයන් පෙනීසිට සියලු ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ ආගමික සම්ප්‍රදායන් යොදා ගන්නට විය.

මිනිසාගේ දුර්වල ස්වභාවය ගැන ගැඹුරෙන් දුටු ෂින්රන් (Shinran) මිදීම හෙවත් මුක්තිය ලබාගත හැකි වන්නේ ආත්ම දමනයෙන් සහ අමිත බුදුන්ගේ මුදා ගැනීමේ බලය පිළිබඳව පූර්ණ විශ්වාසය තැබීමෙන් පමණක් බව ඒත්තු ගෙන සිටියේය. ෂින්රන් (Shinran)ට වැදගත් වූයේ තව දුරටත් අමිත බුදුන් පූජා ලැබීමේ වස්තුවක් ලෙස නොව "නමෝ අමිදා බුද්සු" යන්නය. අමිද බුදුන් උපායක් ලෙස වාස්තවික ව දැක්විය හැක. එහෙත් "නමෝ අමිද බුද්සු" එසේ නොමැත. කෙසේද යත් එය විෂය හා වස්තු අතර සැබෑ සම්බන්ධතාවයයි. එනම් එය ගණිතමය සිදුවීමක් හැර ස්තායී දෙයක් නොවේ. ඔහු එකල හීනයාන සහ මහායාන භික්ෂූන්ට අනිවාර්ය ශීලයන් සම්පූර්ණයෙන්ම අත් හළේය. ඒ වෙනුවට ඔහු විවාහ වූ අතර තමා ලෝකයේ නපුරුම මිනිසා ලෙස ප්‍රකාශ කළේය. පැහැදිලිවම ඔහුට අවශ්‍ය වූයේ සාමාන්‍ය පුද්ගලයන්ගෙන් වෙන්ව ඔහුගේ දුක්ඛිත ආත්මය ආරක්ෂා කර ගැනීමට සහ මිනිසුන්ගේ දුකින් මිදීමේ මාර්ගය සකසා ගැනීමටයි.

මෙකල බෞද්ධ නායකයන් ඔවුන්ගේ වේදනාකාරී ජීවන අත්දැකීම් නැවත බුදුදහමෙන් ඇගයීමට උත්සාහ කළ අතර අවසන් නිගමනය වූයේ ඔවුන් සියලු දෙනාටම බුදුන් පිළිබඳව දැඩි විශ්වාසයක් ඇත්නම් "සුභවාදී බුද්ධත්වය" ලැබීමේ හැකියාව ඇති බවයි. මෙම අදහස පදනම්වූ තෙන්දයි (Tendai) මධ්‍යස්ථානය ඇතුළු මහායාන සම්ප්‍රදායන් "බෝධිසත්ව සංකල්පය" අනුව සෑම සත්වයෙකුගේම "බුද්ධත්ව ස්වභාවය" පවතින අතර එය සාක්ෂාත් කර ගැනීමට හැකියාව ඇති බවද පෙන්වා දුනි.



මිනමොතොනො යොරිතොමොගේ (Minamotono Yoritomo) නව හමුදා පාලනය ක්‍රි.ව. 1192දී කමකුරා හි (Kamakura) පිහිටුවීමත් සමග ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානය පහක් එකින් එක ගොඩනැගෙන්නට විය.

ඒවා නම්;

1. ජෝදෝ (Jodo)
2. ජෝදෝෂින් (Jodoshin)
3. රින්සයිසෙන් (Rinsaisen)
4. සෝතෝසෙන් (Sotosen)
5. නිචිරෙන් (Nichiren) යනුවෙනි.

මෙම සම්ප්‍රදායන් සියල්ලම තෙන්දයි (Tendai) සම්ප්‍රදායේ පොදු මූලික ලක්ෂණ ඔස්සේ ගොඩ නැගුණ ද එකිනෙක සිය අභිමතය පරිදි ක්‍රියාත්මක වූ බව පෙනේ.

ඔවුන් නිතරම ප්‍රභුවාදී ධූරාවලිය සහ එහි න්‍යායාත්මක අනුමිතීන් හෙවත් සංකල්ප නොසලකා පොදු ජනතාවගේ පැත්තේ සිටියේය. මීට පෙර බෞද්ධ කලාවේ ශ්‍රී විභූතිය සහ උත්කෘෂ්ට ප්‍රතිමා චිත්‍ර සහ ආභරණවලින් නියෝජනය කළ උත්සවවලදී සතුටු විය හැකි වූයේ ප්‍රභූ පැලැන්තියට පමණි. මෙවැනි සංසිද්ධීන්ට දැඩි ලෙස නොසතුටට පත් වූ මෙම බෞද්ධ නායකයෝ ඔවුන්ගේ වේදනාත්මක අත්දැකීම්වලින් බුදු දහම නැවත ඇගයීමට උත්සාහ කළෝය. ඒ අනුව ඔවුන් පැමිණි නිගමනය නම් සෑම කෙනෙකුගේම බුදු වීමේ විභව ස්වභාවයක් ඇති අතර කෙනෙකුට ඔහු කෙරෙහි දැඩි විශ්වාසයක් ඇත්නම් බුදු කරුණාවෙන් ආරක්ෂාව ලබා ගත හැකි බවයි. නව මත පදනම් වූයේ මහායාන බුදු දහමේ බෝධිසත්ව දහම මතය. විශේෂයෙන්ම සෑම සචේතනික සත්වයෙකුගේම බුදුන්ගේ ස්වභාවයක් ඇති හෙයින් බුදු වීමේ හැකියාවක් ඇතැයි අදහස් ඉදිරිපත් කළේ තෙන්දයි (Tendai) ගුරුකුලයයි.

ක්‍රි.ව. 1133-1212 කාලයේ ජීවත් වූ හෝනන් (Honan) හිමියන් තෙන්දයි (Tendai) ඉගැන්වීම් ඉතා ගැඹුරින් අධ්‍යයනය කළ අතර එයින් ඔහු අවබෝධ කරගත්තේ විමුක්තිය පිළිබඳ අර්ථ කථනය පමණක් සහ තෙන්දයි (Tendai) සම්ප්‍රදායේ ඇති එහෙත් අනෙකුත් සම්ප්‍රදායන්ගේ නැති සුවිශේෂී බව පමණකි. කෙසේ වුවත් ඔහුට අවශ්‍ය

වූයේ අන් අය දුකින් මුදවාලීමට හා තමාට ද විමුක්තිය ළඟා කර ගැනීමයි. දිනක් ඔහුට ගොන්ෂින් (Gonshin) විසින් සම්පාදනය කළ ඕජෝයෝෂු (Ojoyoshu) හෙවත් "පුනරුත්පත්තියේ මූලික ලක්ෂණ" යන ග්‍රන්ථය පරිශීලනය කරන්නට අවස්ථාව ලැබුණු අතර එහිදී චීන භික්ෂුවක වන සන්දාඕ (Sandao) විසින් රචිත එකේ ඡේදයක් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය. එයින් කියැවුණේ "හදවතින්ම අමිත බුද්ධ අමතන්න" ඇවිදිමින් හෝ හිඳිමින් හෝ නිදා ගනිමින් හෝ අමිත බුද්ධ අමතන්න එයින් නොවරදින විමුක්තිය බුදුන්ගේ පිහිටෙන් ම සාක්ෂාත් කරගත හැකිය.

ඉහත ඉගැන්වීමෙන් ඔහු මෙතෙක් සොයා ගිය මාර්ගය අවබෝධ කරගත් අතර අනෙකුත් සම්ප්‍රදායන්ගේ ඉගැන්වීම් ඔහු අවතක්සේරු නොකළේය. ඔහුගේ අදහස වූයේ මෙම සරල ඍජු අමිත බුද්ධ ඇමතීම තුළින් ඔහුටත් අන් අයටත් විමුක්තිය උදාකර ගැනීමට හැකිවනවා සේම ඒ සඳහා විශේෂ චාරිත්‍ර විධි හෝ සංකීර්ණ දර්ශනයක් අවශ්‍යය නොවන බවයි. එසේම ඕනෑම කෙනෙකුට ඕනෑම තැනක සිට කළ හැකි "Namu Amita Butsu" (අමිත බුදුන්ට නමස්කාර වේවා) යනුවෙන් පැවසීම ප්‍රමාණවත් වන බවයි. ක්‍රි.ව. 1175දී හෝනන් (Honan)හිමියන් විසින් ස්වාධීන ආයතනයක් වූ ශුද්ධභූමි (ජෝදෝ) විද්‍යාස්ථානය මූලික සූත්‍ර දේශනා තුනක් පදනම් කරගෙන ආරම්භ කරන ලද්දේය. මෙම සූත්‍රත්‍රය වන්නේ

1. මහා සුඛාවතීව්‍යූහ සූත්‍රය
2. චුල්ල සුඛාවතීව්‍යූහ සූත්‍රය
3. අමිතායුර් ධ්‍යාන සූත්‍රයයි.

එසේම ඔහුගේ ඉගැන්වීම් සම්පිණ්ඩණය කර Sanchaku Hongen නම් වූ ග්‍රන්ථය රචනා කළ අතර එයින් ඔහුගේ ඉගැන්වීම් අනෙකුත් සම්ප්‍රදායන්ගෙන් ආරක්ෂා කර ගැනීමටත් මහජනතාවට ඔහුගේ ඉගැන්වීම් දේශනා කරන්නටත් කටයුතු කළේය.

කෙසේ වුවද දිනෙන් දින වර්ධනය වන ඔහුගේ ජනප්‍රියත්වයට අනෙක් සම්ප්‍රදායන්ට අයත් මධ්‍යස්ථාන වලින් සහ රජයෙන් විවිධ බාධා එල්ල විය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1207 දී ඔහුගේ ඉගැන්වීම් රාජ්‍ය තහනමට ලක්වූ අතර ප්‍රධාන අනුගාමිකයන් කිහිපදෙනෙකු



සමග චිකොකු (Chikoku) දූපතට පිටුවහල් කිරීමට කටයුතු කෙරිණි. සෑහෙන කාලයකට පසුව ඔහුට ආපසු ඒමට හැකි වූ අතර ඔහුගේ ඉගැන්වීම් සඳහා ද අවසරය ලැබිණි. ඔහුගේ අනුගාමිකයකුවූ ෂින්රන් (Shinran) විසින් තම ගුරුවරයාගේ ඉගැන්වීම් වැඩිදියුණු කර ජෝදෝෂින් (Jodoshin) විද්‍යාස්ථානය පිහිටුවීය.

ක්‍රි.ව. 1173-1262 කාලසීමාවේ ජීවත් වූ ෂින්රන් (Shinran) මානවයාගේ දුර්වලභාවය දැක විමුක්තිය උදාකර ගත හැක්කේ ආත්ම දමනය හා විමුක්ති බලය ඇති අමිත බුද්ධ පිළිබඳ විශ්වාසය තැබීම මත පමණක්ම බව වටහා ගත්තේය.

එයිසන් (Eisan) අවධියේ දී (ක්‍රි.ව.1141-1215) සෙන් (Zen) බුදු දහම ජපානයට හඳුන්වා දුන් අතර එය දෝගෙන් (Dogen) විසින් ස්ථාපිත කළ බව පෙනේ. ඒ වන විට චීනයේ තෙන්දයි (Tendai) සම්ප්‍රදායන් අභාවයට යමින් පැවති අතර සෙන් (Zen) බුදුදහම ප්‍රචලිත වෙමින් පැවතිණි. මේ නිසා එයිගන් (Eigan) ද චීනයටය ගොස් සෙන් (Zen) බුදු දහම අධ්‍යයනය කර නැවත ජපානයට පැමිණීමේදී සෙන් (Zen) ඉගැන්වීම් ඇතුලත් ග්‍රන්ථ රාශියක් රැගෙන ආවේය. ඒ අතර Rinsairoku (Analects of Master Linchi) Hekiganroku (The blue cliff record) සහ Kaian kokugo (The story of the country Huaian) ප්‍රධාන තැනක් ගනී. මෙම මූලාශ්‍රය පදනම් කරගෙන එයිගන් (Eigan) විසින් රින්සයිසෙන් (Rinsaizen) බෞද්ධ සම්ප්‍රදාය ජපානයේ ස්ථාපිත කිරීමට කටයුතු කළේය. මෙහි පදනම සෙන් (zen) oyමේ මූලික ඉගැන්වීම් තුනෙන් කිසිවක් මත නොව තමාගේ සත්‍යතාව මත පිහිටා සිටිය යුතු බවත් සෑම දෙනකු තුළ ම බුද්ධත්වයට පත්වීමේ හැකියාව පවතින බවත් එය අපේ පවතින "මායාව" හෙවත් මිත්‍යාව නිසා වර්ධනය වී ඇති බවත්ය.

සෙන් (zen) දහමේ මූලික පරමාර්ථය වූයේ අපේ පවතින මායාව ඉවත් කිරීමත් ඉන් මිදුණු කෙනකු තුළ පවතින අභ්‍යන්තර ස්වභාවය දැකීමත්ය. මෙම තත්ත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා ජීවිතයේ සත්‍යාවබෝධය ලැබීමට හා අභ්‍යන්තරය අවදි කරවීමට භාවනානුයෝගී වීම හා කෝඅන් (Koan)අධ්‍යයනය අවශ්‍ය බවද පෙන්වා දෙයි. කෝඅන් (Koan) යනු භාෂාමය මෙවලමකි. මෙය ගැටලුවක් ලෙස යොදා ගැනේ. උදාහරණයක් ලෙස ඔබගේ මව ඔබට උත්පත්තිය දීමට පෙර ඔබගේ මුහුණේ ඇති ස්වභාවය කෙබඳුද?

නැතහොත් ඔබගේ දේහය දවාලීමෙන් පසුව ඔබගේ භස්මාවශේෂ සුළඟේ ගසාගෙන ගියායින් පසු ඔබ කොහි දිව ගියේද? ආදි වශයෙනි. මෙවැනි ගැටලුවකට පිළිතුරු තාර්කික හේතු පෙන්වා දීමකින් තොරව වහා ලබාදිය ලබා දිය යුතු විය. මේ නිසාම සෙන්(zen) දහම දාර්ශනික අභ්‍යාසයක් නොවූ අතර එය ජීවන මාර්ගයක් වූ බව පෙනේ. මෙම ඉගැන්වීම් සඳහා හමුදා පාලනයෙන් අනුග්‍රහය ලැබුණු අතර කමකුරා හෝජෝ (Kamakura Hojo) වංශිකයින් සහ රාජ්‍ය පාලකයින් යෝගාශ්‍රම හා විහාරස්ථාන ඉදි කිරීම සඳහා විශාල අනුග්‍රහයක් දැක්වීය.

ක්‍රි.ව. 1200-1253 අවධියේ සිටි දෝගෙන් (Dogen) ද චීනයේ දී සෙන් (zen) දහම හදාරා ජපානයට පැමිණ සෝතෝසෙන් (Sotozen) නිකාය ආරම්භ කළේය. ආරම්භයේ සිටම ඔහු ලෞකික කටයුතු පිළිබඳ ඇල්මක් නොදැක්වූ අතර හමුදා ආණ්ඩුව හෝ පාලනාධිකාරිය පිළිබඳ තැකීමක් නොකළේය. ඔහු විසින් ෆුකුයි (Fukui) පළාතේ එයිහෙයිජි (Eiheiji) යෝගාශ්‍රමය ගොඩනැගූ අතර සෙන් (zen) ඉගැන්වීම් ඇතුළත් කාණ්ඩ 95ක් රචනා කළේය. විමුක්තිය ළඟාකර ගැනීම සඳහා ඒකායන මාර්ගය භාවනායෝගී වීම පමණක් බව සෙන්(zen) දහමේ මූලික ඉගැන්වීම විය. ඒ සඳහා කිසිදු හේතු දැක්වීමක් හෝ අනුමාන කිරීම් අවශ්‍ය නොවේ. සෙන්(zen) දහම බුදුන්ගේ ගුප්ත බැඳීමක් හෝ යම් ආගමික වස්තූන් අතර නිශ්චිත කාලයක හෝ ස්ථානයකදී සිදු වන ගැටුමක් ද නොවන අතර ඕනෑම අවස්ථාවකට සරිලන ජීවත් වීමේ මාර්ගයක් වන්නේය. එය සාමයෙන් අර්ථාන්විතව සතුටින් ජීවත් වීමේ සහ මිය යාමේ මාර්ගය කියා දෙයි. මෙම ඉගැන්වීම් සතුරන්ගේ සිත් දිනා ගැනීමට සමත් වේ. මෙයින් "සතුරාගේ ආත්මය" හෙවත් බුෂිදෝ (Bushido) සංකල්පය වර්ධනය විය.

ක්‍රි.ව. 1222-1282 කාලයේ ජීවත් වූ නිචිරෙන් (Nichiren) එවකට පැවති සියලු බෞද්ධ සම්ප්‍රදායයන් අධ්‍යයනය කළ අතර, ඒ අතරින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය (Lotus Sutta) පමණක් පිළිගත් අතර ඔහු විසින් ජපන් සම්භවයක් ලෙස නිචිරෙන් (Nichiren) නිකාය ගොඩනැගූ අතර අප තුළ ඓතිහාසික බුදුන්ගේ අමරණීය ජීවිතය අනාවරණය කරගත හැකි බව ප්‍රකාශ කළේය. ඔහුගේ ඉගැන්වීම වූ "Namu myohorenge kyo" යන්න සජ්ඣායනා කිරීමෙන් අමරණීය බුදුන් සමග එක්වී බුද්ධත්වයට පත්වීමට හැකි බවද අවධාරණය කළේය. එසේම ඔහු එවකට පැවති සියලූ නිකාය හා සම්ප්‍රදායන්



සත්ත්වයාගේ මතු භවයේ විමුක්තිය ලැබීම පදනම් කරගත් ඉගැන්වීම් බව පවසමින් ඒවා විවේචනය කළේය.

ඔහුගේ මතයට අනුව මෙම සද්ධර්ම පුණ්ඩරීක දේශනාව හැර වෙනත් කිසිදු ඉගැන්වීමක් මෙලොව ජීවත් වන අපට නොමැති බවත් එය ඍජු හා ඒකායන මාර්ගය ලෙස දේශනා කළේය. රාජානුග්‍රහය ලැබීම හා ඔහුගේ මතවාදය අනුව රාජ්‍යය පාලනය අපේක්ෂාවෙන් Rishshi Ankokuron (The establishment of righteousness in the rule of the country) නම් ග්‍රන්ථය රචනා කළ අතර, රාජ්‍ය පාලකයන් ගෙන් ඒ සඳහා කිසිදු අනුග්‍රහයක් නොලැබුණු අතර මේ වෙනුවෙන් ඔහුට දඬුවම් විඳින්නට ද සිදුවිය. ඒ අනුව ඔහු ඉෂු (Ishu) අර්ධද්වීපයට සහ සෝදෝ (Sodo) දූපතට පිටුවහල් කළේය. පසුකාලීනව ඔහුට රාජ්‍යය සමාව හිමි වූ අතර ආපසු කමකුරා (Kamakura) වලට පැමිණීමට හැකිවිය. එසේ පැමිණීමෙන් පසුව මිනොබු (Minobu) කඳුකරයේ කුඔන්ජි (Kuonji) විහාරස්ථානය ගොඩ නගාගෙන ජීවිතයේ ඉතිරි කාලය ගත කළේය. සමකාලීන ජපානයේ බිහිවූ අනු ආගමික සම්ප්‍රදායන් සඳහා මොහුගේ ඉගැන්වීම් වල ආභාසය ලැබී ඇති බව ද පෙනී යයි.

මෙම අවධියේ දී වෙනත් දාර්ශනික මතවාදයන් දැරූ බොහෝ අය සිටිය ද එතෙක් පැවති හෝසෙන් (Hozen)" Iskarka (Shinran), එයිසන් (Eisan), දෝගෙන් (Dogen)සහ නිචිරෙන් (Nichiren) තරම් පිළිගැනීමක් නොවීය. කමකුරා (Kamakura) අවධියෙන් පසුව ජෝදෝසෙන් (Jodozen) දහම සහ නිචිරෙන් (Nichiren) ඉගැන්වීම් පමණක් උද්දීපනය වූ බව පෙනේ.

මෙම අවධියේදී කලාව හා සාහිත්‍යයේ යම් පිබිදීමක් දැකිය හැකි වුවද ඊට වඩා අලුතින් බිහිවූ ආගමික විද්‍යස්ථාන විසින් විනය හා ඒකාග්‍රතාව මෙන්ම ආගමික මුහුණුවර හුවාදැක්වීම කැපීපෙනේ. මේ හේතුව නිසා ජපන් ඉතිහාසයේ ආගමික නැඹුරුව එහි උච්චස්ථානයට ළඟා උච්චස්ථානයට ළඟා වූ අතර ඒවා සියලුම බාහිර බැඳීම් බාධක අභිබවා ගියේය.

කමකුරා (Kamakura) හමුදා පාලන තන්ත්‍රය යටතේ ජපානයේ ක්‍රි.ව.1274-1281 කාලය පරිච්ඡේදය තුළ ඇතිවූ මොංගෝලියානු ආක්‍රමණයන් පරදා එක් සේසත් වුවද ඊළඟ සියවසේදී හමුදා පාලන

තන්ත්‍රය කඩා වැටුණි. මේ හේතුවෙන් ජපානය නැවත ඇතිවූ සිවිල් යුද්ධ කීපයක්ම නිසා දේශපාලනමය හා සමාජීය අස්ථාවරත්වයට ලක් වූ නිසා පොදු ජනතාවද අසහනයට පත්වූහ. මේ නිසා ජනයා ආගම කෙරෙහි නැඹුරු වූ අතර අවලෝකිතේශ්වර බෝසතුන් ඇදහීම, සරණ යාම කෙරෙහි විශාල නැඹුරුවක් ද දැක්වීය.

ක්‍රි.ව.1336 දී අෂිකග තකඋජි (Ashikaga Takauji) විසින් නැවත හමුදා පාලනයක් ඇති කොට රට එක් සේසත් කළේය. රාජ්‍ය අනුග්‍රහය හා මහජන ආධාර මගින් ආගමික සිද්ධස්ථාන රාශියක් ගොඩ නැගුණු අතර බෞද්ධ ආභාසය ලද ජපානයේ සංස්කෘතිය ද ඉතා ඉහළ සංවර්ධනයකට ලක් විය. චීන බෞද්ධ භික්ෂූන් විසින් හඳුන්වා දුන් චිත්‍ර කලාව, අක්ෂර කලාව, තේ උත්සවය, ඉකෙබනා කලාව, උද්‍යාන කලාව, ජපාන සංස්කෘතිය ගොඩනැගීමෙහි ලා විශාල පිටුවහලක් වූ අතර අද ඒ දක්වාම ක්‍රමික සංවර්ධනයකට ලක් විය. කෙසේ වුවද රජයේ හා අධිරාජයා වංශිකයන්ගේ විශේෂ අනුග්‍රහය නිසා බෞද්ධ සම්ප්‍රදායයන් කිහිපයකට වැඩි වරප්‍රසාද හිමි වීම හේතුවෙන් අනෙකුත් ආගමික සංස්ථා හා ඔවුන් අතර ද්වේෂ සහගත ගැටුම් උත්සන්න විය. විශේෂයෙන්ම හෙයිඅයි (Heiai) සහ කෝයා (Koya) කඳු පෙදෙස්වල පිහිටි තෙන්දයි (Tendai) හා ෂින්ගොන් (Shingon) විද්‍යාස්ථාන ඔවුන්ගේ ආධිපත්‍යයේ කේන්ද්‍රස්ථාන විය. එහි භික්ෂූන් තමන්ගේ ආගමික නායකත්වයට වඩා හමුදාමය හා දේශපාලනමය නායකත්වය පිළිබිඹු වන සේ කටයුතු කළ බව පෙනේ. සෙන් (Zen) විහාරස්ථාන සහ ආගමික මධ්‍යස්ථාන භික්ෂූන්ගේ වාසස්ථාන බවට පරිවර්තනය වූ අතර ලෞකික කටයුතුවලින් වෙන්ව ඔවුන් භාවනානුයෝගී වීමට හෝ කලා නිර්මාණකරණයේ නිරත වීමට උත්සුක වූ බව පෙනේ. ජෝදෝ (Jodo) හා ජෝදෝෂින් (Jodoshin) විද්‍යාස්ථාන මෙකල එතරම් ජනප්‍රිය නොවූවද ඔවුන් ක්‍රමිකව සමාජයේ මුල්බැස ගැනීමට සමත් විය.

ක්‍රි.ව. 1573 දී ඕද නොබුනග විසින් (Oda Nobunaga) අෂිකගගේ (Ashikaga) හමුදා පාලනය අත්පත් කර ගැනීමත් සමග බෞද්ධ සිද්ධස්ථාන මර්දනය කිරීමට පෙලඹිණි. එයට හේතු වූයේ ඔහුගේ සතුරන් සමඟ එක් වී මෙම ප්‍රමුඛ පෙළේ බෞද්ධ සිද්ධස්ථාන ඔහුට විරුද්ධව කටයුතු කරනු ඇතැයි ඔහු දැඩි සේ විශ්වාස කළ බැවිනි. දේශපාලනික වාසි අපේක්ෂාවෙන් ජපානයට ඇතුළු වූ ක්‍රිස්තියානි



දර්ශනයට ඔහු අනුග්‍රහය දැක්වීය. නොබුනගගේ (Nobunaga) ඇවෑමෙන් පාලනය සියතට ගත් තොයොතොමි හිදොයොෂි (Toyotomi Hidoyoshi) ද බෞද්ධ මධ්‍යස්ථාන මර්දනයට කටයුතු කළ අතර නොබුනග(Nobunaga) සහ හිදොයොෂිගේ (Hidoyoshi) මෙම ක්‍රියා කලාපය නිසා එතෙක් පැවති බෞද්ධ කලා සම්ප්‍රදායන් අභාවයට ගිය අතර ඒ වෙනුවට ලෞකික කලා සම්ප්‍රදායන් බිහිවිය.

ක්‍රි.ව.1603දී tfod(Edo) අධිරාජයා විසින් වර්තමාන ටෝකියෝහි සිය පාලන තන්ත්‍රය පිහිටුවන ලද අතර ජපන් වැසියන්ට රටින් පිට වීමත් විදේශිකයන්ට විශේෂම හේතුවකට හැර රටට ඇතුළු වීමත් තහනම් කරන ලදි. මෙම හුදකලා බව වසර 260 කට වඩා වැඩි කාලයක් පැවති අතර මෙම කාලය තුළ බුදු දහම ද ස්ථාවර වූ අතර නොබුනග (Nobunaga) සහ හිදොයොෂි (Hidoyoshi) විසින් විනාශ කරන ලද බෞද්ධ විද්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කර ස්ථාවරත්වයට පත් කරන ලදි. එසේම පෞද්ගලිකව ජෝදෝ (Jodo) විද්‍යාස්ථානයට සහාය දැක්වූ අතර ටෝකියෝහි ෂෝජෝජි (Zoujoji) විහාරස්ථානය හා කියොතෝහි චිඔන්ඉන් (Chionin) ඇතුළු තවත් විහාරස්ථාන රැසක් ගොඩ නැගීමට ද කටයුතු කරන ලදි.

තවද ඔහු ආර්ථිකමය, පරිපාලනමය අවශ්‍යතා වෙනුවෙන් හිගෂි හොන්ගන්ජි (Higashi Honganji) විහාරස්ථානය ගොඩනැගීමට පියවර ගත් අතර ජෝදෝෂින් (Jodoshin) විහාරස්ථානය නැගෙනහිර හා බටහිර වශයෙන් කොටස් දෙකකට වෙන් කළේය. ඔහුගේ ඇවෑමෙන් පසු බලයට පත්වූ පාලකයෝ ද බුදු දහමට මුල් තැනක් දී කටයුතු කළ අතර ක්‍රිස්තියානි දර්ශනයද පවත්වාගෙන ගියහ. බෞද්ධ සිද්ධස්ථානවල බලය දුර්වල කිරීමට හා පාලනය කිරීමට ද, විදේශීය ආක්‍රමණයන්ගෙන් ජපානය බේරා ගැනීමට ද මෙම ක්‍රියාමාර්ග ගත් බව පෙනේ. මෙම කාල සීමාවේදී සියලු විහාරස්ථාන උපත්, විවාහ, මරණ හා අවමංගල උත්සව ලියාපදිංචි කිරීමේ මධ්‍යස්ථාන බවට පත් කළ අතර ඒ නිසාම පවුලේ විහාරස්ථාන බවට පත්විය. භික්ෂූන් වහන්සේලා සැහැල්ලුවෙන් හා නිදහස්ව වාසය කළ අතර අනුගාමිකයින්ට වාචික උපදේශ පමණක් ලබාදීමට කටයුතු කළ බව පෙනේ. කරුණු එසේ වුවද මෙම තත්ත්වය නොසලකා සෙන් (Zen) දහම යම් ස්ථාවරත්වයක් පෙන්වූ අතර හකුඉන්ගේ (Hakuin) ආගමනයත් සමඟ රින්සයිසෙන් (Rinsaizen) සම්ප්‍රදාය ඔහුගේ මනා

පෞරුෂත්වය හා දේශනා මත ස්ථාවර විය. මෙහිදී ඉස්මතු වූ බෂෝ (Basho) අක්ෂර 17කින් සමන්විත හයිකු (Haiku) කාව්‍ය සම්ප්‍රදාය බිහි වීමත් සමඟ සෙන් (Zen) දහම වඩාත් ප්‍රචලිත විය.

ක්‍රි.ව. 1655 දී ආරාධිත ව චීනයෙන් පැමිණි ඉන්ගන් (Ingan) විසින් ඔබකුසෙන් (Obakuzen) සම්ප්‍රදාය බිහි කළේය. එමෙන්ම තෙත්සුගෙන් (Tetsugen) විසින් ත්‍රිපිටකයේ මිං (Ming) සංස්කරණය ක්‍රි.ව. 1681 දී පමණ නැවත මුද්‍රණය කළේය. කෙසේ වුවද 17 වන සියවසේ සිට බුදු දහම ක්‍රමක්‍රමයෙන් පරිහානියට ලක් වූ අතර ඒ වෙනුවට කොන්ෆියුසියස් :Confucius) දහම සහ ෂින්තෝ (Shinto) දහමේ ආගමික හා දේශපාලනික දර්ශනවාදයන් ඉස්මතු වන්නට විය.

ආරම්භයේ දී බුදු දහම සහ ෂින්තෝ (Shinto) දහම පිළිගැනීමට පාත්‍ර වුවත් පසුකාලීනව ඒ ඒ සම්ප්‍රදායන්ගේ කාර්යභාරය අනුව බුදු දහම ෂින්තෝ (Shinto) දහම සහ කොන්ෆියුසියස් (Confucius) දහම වෙන වෙනම පෙනී සිටියහ. බුදු දහම ආගමික කාර්යයන්ද කොන්ෆියුසියස් දහම මානසික වර්ධනය ද ෂින්තෝ (Shinto) දහම රාජ්‍ය පාලන කටයුතුවලට ද සම්බන්ධ විය. මෙම තත්ත්වය සිතා මතාම හෝ නොසිතා ජපන් ජනතා සිත් තුළට කා වැදුනු අතර අදටත් එම තත්ත්වය එසේම පවතී. ඒ අනුව බුදුදහම අත්‍යවශ්‍යය ආගමික අංගයක් නොවූ අතර එම සම්ප්‍රදාය කමකුරා (Kamakura) අවධියේ සිට භික්ෂූන් සහ දේශකයන් විසින් පාරම්පරිකව පවත්වාගෙන ඒම පමණක් සිදුවිය. ක්‍රි.ව.1868 දී මෙයිජි (Meiji) පාලන සමයේ ආරම්භයත් සමග වසර 800 ක් පමණ දිගු කාල පරිච්ඡේදයක් තුළ පැවැති හුදකලා බව පහව ගොස් අධිරාජ්‍ය වංශිකයන්ට පාලන බලය හිමිවිය. බටහිර සංස්කෘතිය හා තාක්ෂණය රටට ගලා ඒමට දොරටු විවර විය. මෙයිජි (Meiji) පාලනයේ ප්‍රතිපත්තිය වූයේ ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කිරීමයි. ඒ අනුව ජපානය බටහිර සංස්කෘතිය හා තාක්ෂණය නවීකරණයේ මාර්ගයක් ලෙස භාවිතා කළ අතර එය අධිරාජ්‍ය වංශිකයන් විසින් ද අනුමත කරන ලදහ.

ඒ අනුව එතෙක් ක්යෝතෝහි (Kyoto) පැවති පැරණි රාජධානිය ක්‍රි.ව. 1868 දී වර්තමාන තෝකියෝවට (Tokyo) රැගෙන ආ අතර එය ජපානයේ සශ්‍රීකත්වයට හේතු විය. ෂින්තෝ (Shinto) දහමට අනුව වන්දනීය ජීවමාන දෙවියන් ලෙස සලකන ලද්දේ අධිරාජයාය. ඒ අනුව



බුදු දහමට පැවැත්මක් නොතිබූ අතර එය මුලසිටම ෂින්තෝ (Shinto) දහමින් වෙන් වී ගියේය. ක්‍රි.ව. 1868 දී මෙයිජි (Meiji) පාලනය විසින් බෞද්ධ විශ්වාසයන් හා වන්දනා ක්‍රම තහනමට ලක් කරන ලද්දෙය. බොහෝ බෞද්ධ මධ්‍යස්ථාන සහ කලා නිර්මාණයන් විනාශ කිරීම හෝ විකුණා දැමීම සිදුවිය. බොහෝ භික්ෂූන් ට නැවත ගිහි ජීවිතයට පැමිණෙන ලෙසට බලපෑම් කළේය. කෙසේ වුවද පසුකාලීනව මෙම තහනම ලිහිල් වූ අතර එවකට පැවැති සියලු බෞද්ධ විහාරාරාම ප්‍රධාන නිකාය දහතුනකට සහ අනු නිකාය පනස් හයකට වෙන් කළ අතර, අලුතින් නිකාය හෝ සම්ප්‍රදායන් ඇති කිරීම සපුරා තහනම් විය.

වාසනාවකට හෝ අවාසනාවකට ජපන් වැසියන් විසින් තම සංස්කෘතියේ සහ සම්ප්‍රදායේ කොටසක් ලෙස බුදුදහම සැලකූ නිසා එහි ආගමික විශ්වාස හෝ පූජා විධි ක්‍රමවලින් පරිබාහිරව සමාජයේ පහළ ස්ථර දක්වාම පිළිගැනීමට පාත්‍ර විය. පැවති දුෂ්කරතා මධ්‍යයේ භික්ෂූන් වහන්සේ ඉතා සුළු පිරිසක් තම සම්ප්‍රදායන් ආරක්ෂා කර ගැනීමට උත්සුක වූහ. ඔවුන් ද තම සම්ප්‍රදායන් නූතන බුද්ධිමතුන්ගේ උපකාර ඇතිව නැවත ඇගයීමට ලක් කළද, කාලයත් සමඟ මෙම ඉගැන්වීම් සහ සම්ප්‍රදායන් සමාජගත කිරීම ජාතිකවාදී හමුදා පාලනයේ විවිධ බාධා කිරීම්වලට ලක් වූ අතර පළමුවන හා දෙවන ලෝක යුද සමයන්හි දී මෙම බෞද්ධ සිද්ධස්ථාන රාජ්‍ය අවශ්‍යතා සඳහා භාවිත කරන්නට විය.

ක්‍රි. ව. 1945 දී එවකට පැවති හමුදාමය පාලනය ඒකාබද්ධ බලවේග යකට යටත් වූ නිසා බුදු දහම බෞද්ධ ආයතනවල හෝ රජයේ හෝ වෙනත් වරප්‍රසාද ලත් පන්තියක අධිකාරී බලයක් වූයේ නැත. බෞද්ධ අධ්‍යාපනය වැඩි දියුණු කරන ලද්දේ භික්ෂූන්, අමාත්‍යවරුන් විහාරස්ථාන සහ උසස් අධ්‍යාපන ආයතනවල විද්වතුන් විසිනි. පැරණි බෞද්ධ කලා නිර්මාණයන් රාජ්‍ය ආරක්ෂාව යටතේ විහාරස්ථානවල හා කෞතුකාගාරවල සංරක්ෂණය කරන ලදී. විනාශ වූ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කර ඒවා අධ්‍යාපන මධ්‍යස්ථාන හෝ වන්දනා ස්ථාන ලෙස භාවිත විය. ජපානයේ අන්තර්ජාතික බෞද්ධ සම්මේලන රාශියක් පවත්වා ඇති අතර දැනුම හා පුද්ගලයන් හුවමාරුව සඳහා ද වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වී ඇත.

ඉහත සාකච්ඡා වූ පරිදි සංක්ෂිප්ත ජපන් බුදු දහමෙහි ඉතිහාසය අනුව වර්තමානයේ දී අන්ත දෙකක් දැකිය හැකිය. එයින් එක් අන්තයක් ඉහළ සිට පහළටද අනෙක පහළ සිට ඉහළටද ගලායයි. මුලින් කී අන්තයට බහුතර භික්ෂූන් අයිති වන අතර ඒ සඳහා රාජ්‍ය ආගමික තත්ත්වයක් නොමැත. අනෙක් අන්තය "පහත්" හෙවත් "ජනප්‍රිය" බුදුදහම සේ හැඳින්විය හැකි අතර මෙයට ගිහි ජනතාව ඇතුළත් වේ.

ජපන් බෞද්ධ ඉතිහාසයේ මෙම අන්ත දෙක එකිනෙකට ප්‍රතිවිරුද්ධ ලෙස වර්ධනය වී ඇත. එනම් උසස් බුදු දහම පිරිහෙන විට ජනප්‍රිය බුදුදහම වර්ධනය වේ. ජනප්‍රිය බුදුදහම පිරිහෙන විට උසස් බුදු දහම වර්ධනය වේ. තවත් විදියකින් කියතොත් උසස් බුදු දහම එකතැන පල්වන විට ජනප්‍රිය බුදුදහම සමාජමය තත්වයන්ට ගැළපෙන පරිදි වෙනස් වේ. අද වන විට මෙම අන්ත දෙක ම එකිනෙක හා ගැටෙමින් ඒවායේ ඇතුළාන්තය හා බාහිර ස්වරූපය වර්ධනය වෙමින් පැමිණ ඇත.

ජපන් බසින් "විශ්වාසය" යන්න "ප්‍රගතිය" ලෙසද හැඳින්විය හැකිය. එහි අදහස වන්නේ යමක් පිටින් පැමිණීම වඩා හොඳ බවයි. මේ නිසාම ජපන් බුදුදහමේ හින්දු, ෂින්තො, කන්ෆියුසියස්, තාඕ හා ක්‍රිස්තියානි ආදි විශ්වාසයන්ට ප්‍රතිවිරුද්ධ ගතිලක්ෂණ දැකිය හැකිය. බොහෝ ජපන් බෞද්ධයන් බුදුන්ගේ ඇති ලෝකය පුරා පැතිරෙන ගුණවත් බවට ගරු කරන අතර එය පාරගම්‍ය වුද ද්‍රව්‍යමය තත්ත්වයක් නොවූ දෙයක් නොවූ ලෙස සලකයි. අප එහි කොටස්කරුවන් නොවේ නම් එහි ජීවත් නොවන්නේ නම් එය ග්‍රහණය කළ නොහැක. මෙය මහායානික අදහසක් වන අතර අප කුමන තරාතිරමක ට අයත් වුවත් බුදුන්ගේ දෑත් මත සිටින බව උගන්වයි.

බුදු දහමේ මූලික ස්වරූපය වෙනස් වී එහි සුවිශේෂී බව ගිලිහී ගොස් ඇති බව සමහරෙක් ප්‍රකාශ කළ ද එය එතරම්ම සත්‍ය නොවේ. නූතන තාක්ෂණය හා බටහිර අදහස් ද සංකලනය වෙමින් එහි සියවස් ගණනක් පැරණි සම්ප්‍රදායන් ද ආරක්ෂා කරගනිමින් වර්ධනය වී ඇති බව කිව හැකිය.

කෙසේ වෙතත් මෙම සංධිස්ථානයේ දී ජපානයේ බුදු දහම එකතැන පල්වෙමින් සිටියහොත් තම විනාශය ද ඉදිරි දැක්මකින් යුත් උත්සාහයෙන් ක්‍රියාත්මක වුවහොත් තම ඉදිරි පැවැත්ම ද ළඟා කර ගන්නා බව පෙනේ.



වර්තමානයේ දී ජපන් වැසියාට බුදු දහම ඔවුන්ගේ සංස්කෘතියේ හා සම්ප්‍රදායේ කොටසක් ලෙස පමණක් නොව ආගමක් හා ජීවන මාර්ගයක් ලෙසද දැකීමට අවස්ථාව උදාවී ඇත. එපමණක් නොව ඔවුන් විශ්වාසයෙන් විමුක්ත බවටද පත්වී ඇත. පුද්ගල මනස නැවත වරක් සියලු බාහිර බන්ධනයන්ගෙන් නිදහස් වේ. මේ අවස්ථාවේදී දැනටමත් පිහිටුවා ඇති හෝ තවමත් ස්ථාපිත වී නොමැති චින්තන, ආගමික, දාර්ශනික හා සදාචාර පද්ධතීන් ගෙන් තමන්ගේ විශ්වාසයන් තෝරා ගැනීමට ඔවුන්ට නිදහස තිබේ. ඔවුන්ගේ ජීවන මාර්ගය කියාදීමට වඩාත් සුදුසු දර්ශනය සොයා ඔවුන් අරගල කරන බව පෙනෙයි. ඔවුන් යන්නේ කොහේදැයි කිසිවකුට හරියටම කිව නොහැකිය. එසේ නමුත් එක් දෙයක් පැහැදිලිය. ඒ අතීතයේ මෙන් සංස්කෘතියේ හා සම්ප්‍රදායේ මෙවලම් බවට පත්වනු වෙනුවට තමන්ගේ අනාගතය පිළිබඳ කදිම නිර්මාණකරුවන් බවට පත්වෙමින් පවතින බවයි.

ජපන් බුදුදහමේ වර්තමාන තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී ජපානය මුළුමනින්ම ලෞකිකකරණය වූ රටක් ලෙස කෙනෙකුට සිතන්නට පුළුවන. එසේ වන්නේ ජපන් ජාතිකයන් ප්‍රධාන උත්සව සහ අවමංගල උත්සව වැනි ආගමික කටයුතුවලදී යම් නුහුරු බවක් දැක්වීමයි. විශේෂයෙන්ම ජපන් තරුණ පරම්පරාවෙන් ඔවුන්ගේ ආගමික විශ්වාසයන් පිළිබඳව විමසුවහොත් කෙළින් පිළිතුරක් දීමට මැලි වන අතර,මද සිනහවක් පෑමෙන් නිහඬ වෙයි. එහෙත් වැඩිහිටි පරම්පරාව ආගම යනු මූලික සමාජ සමගිය ගොඩනැගීමේ පදනම ලෙස හෝ ජීවිතයේ විඳීම් සඳහා සහනයක් ලැබෙන්නක් ලෙස විශ්වාස කරයි. බොහෝ නිවෙස්වල බුදු කුටියක් හෝ ෂින්තෝ (Shinto) දෙවොලක් දැකිය හැකි අතර, ඒ මගින් නිවසේ හා පවුලේ ආරක්ෂාව සැලසෙනු ඇති බවට විශ්වාස කෙරේ. ජපන් ජාතිකයන් වාහනයක් මිලදී ගත්විට බෞද්ධ භික්ෂුවක් හෝ ෂින්තෝ (Shinto) භික්ෂුවක විසින් පේ කරන ලද (ආශීර්වාද කරන ලද) සීනුවක් එල්ලනු ලබයි.

2002 වසරේදී ජපන් සංස්කෘතික අමාත්‍යාංශය මගින් ප්‍රසිද්ධ කරන ලද සංඛ්‍යා ලේඛන අනුව බෞද්ධයන් මිලියන 95ක් ද භික්ෂු භික්ෂුණීන් පන් ලක්ෂයක් ද ෂින්තෝ (Shinto) අනුගාමිකයන් මිලියන

106ක් සිටින බව ද බෞද්ධ ආයතන 86000ක් තිබෙන බව ද ප්‍රකාශ විය. ඒ අනුව එවකට සිටි මුළු ජනගහනය මිලියන 120 ඉක්මවා යනු ඇත. මෙම සංඛ්‍යා ලේඛන ලබාගෙන ඇත්තේ බෞද්ධ විහාරස්ථානවල හා ෂින්තෝ (Shinto) විහාරස්ථානවල ලියාපදිංචි ලේඛන ඇසුරිනි.

මෙම තත්වය වෙනත් රටවල ආගමික පරිසරයට නුහුරු වුවද ජපානයට එතරම් අරුමයක් නොවේ. එයට හේතුව ජපන් වැසියන් එකම ආගමක අනුගාමිකයෙකු විය යුතු බවට නියමයක් නොමැති බැවින් ඔවුන්ට බුදු දහමේ හෝ ෂින්තෝ (Shinto) දහමේ අනුගාමිකයකු වීමේ බාධාවක් නොමැත. ඉහත දත්ත අනුව එම මිලියන 95ක බෞද්ධ ජනතාව සැබෑ බෞද්ධයන් ද යන්න පිළිබඳව සිතා බැලිය යුතුය. ජපන් වැසියෙකු ගෙන් "ඔබ බෞද්ධයෙක්ද" යන ප්‍රශ්නය විමසුවහොත් පිළිතුර බොහෝ විට "එසේ විය හැකියි" යන්නයි. ඒ ප්‍රශ්නය "ඔබ හොඳයිද" නැතහොත් "ඔබ ලස්සනයි ද" යන ප්‍රශ්නය වැනි ය. මෙයින් පෙනී යන්නේ ඔවුන් එක් ආගමික මතවාදයකට කොටු වීමකට දක්වන අකමැත්තයි. එක් ආගමික මතවාදයක එල්බ සිටීමට වඩා, වඩාත් යහපත් තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීමට පමණක් ආගම යොදා ගැනීම ඔවුන්ගේ අභිප්‍රායයයි.

## නිගමනය

ජපන් බුදුදහම විකාශනය වීමේ දී ඒ සඳහා චීනයේ පැවැති බෞද්ධාගමික දර්ශන හා මතවාද බොහෝ සෙයින් බලපා ඇති බව පෙනේ. ජපානයට බුදු දහම කොරියාවෙන් ලැබුණද, චීන බුදු දහම මත පදනම් ව විකාශනය වන අයුරු එහි ඓතිහාසික පසුබිම විමසා බැලීමේදී හෙළි වන වැදගත් කාරණයකි. ක්‍රි.ව. 5 වන සියවසෙන් ආරම්භව ක්‍රි.ව. 1800 දක්වා තරම් වූ කාල පරිච්ඡේදය පුරාම ජපානයේ ආගමික නායකයින් වරින්වර චීනයට ගොස් බුදු දහමේ ඉගැන්වීම්, විවිධ සම්ප්‍රදායන්, විවිධ නිකායන් යටතේ අධ්‍යයනය කොට නැවත ජපානයට පැමිණ නව සම්ප්‍රදායන් ද බිහි කරන ලද බව පෙනේ. තවද ජපානයේ ආගමික පසුබිම විමසීමේ දී පෙනී යන්නේ බුදු දහම ෂින්තෝ (Shinto) දහම පමණක් නොව කොන්ෆියුසියස් (Confucius) දහම සහ ක්‍රිස්තියානි දහම ද ඒ ඒ කාල පරිච්ඡේදයන්ගේ ජපානයේ පැවති බවයි. බුදු දහම ජපානයේ ස්ථාපිත වීමේ දී රටේ පවතින දේශපාලන වාතාවරණය ද බෙහෙවින් බලපා ඇති බව පෙනෙන



අතර රාජ්‍යපාලනය සහ බුදු දහම අතර දැඩි සබඳතාවක් තිබූ අතර, ඒ ඒ කාල පරිච්ඡේදයේ ආගම සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය මෙන්ම රාජ්‍ය විරෝධය ද සැලකිය යුතු අන්දමින් කැපී පෙනෙන්නකි. එසේම සමහර පාලකයන්ගේ එවකට වඩාත් පිළිගැනීමට ලක් වූ නිකායන් හෝ සම්ප්‍රදායන් කෙළින්ම රාජ්‍ය පාලන කටයුතුවලට සම්බන්ධ වූ අවස්ථාද නැතුවා නොවේ. මෙම තත්වය යටතේ ජපානය තුළ බුදු දහමේ ඇති ආගමික ස්වරූපයද අනෙක් ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් වන ෂින්තෝ (Shinto) සහ කොන්ෆියුසියස් (Confucius) දහමේ ඉගැන්වීම් ජපන් වැසියාගේ ජීවිතය හා බද්ධ වී පවතී. මේ හේතුව නිසාම බහු ආගමික පරිසරයක් නිර්මාණය වී තිබෙන බවද වර්තමානය වන විට ද එම තත්ත්වය දැකිය හැකි බවද පැහැදිලිය.